**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයාගැනීම හා සබැඳි නඩුව

**Case no (නඩු අංකය):** PUTTLAM /TAB 107/2021

**Courts (අධිකරණය):** පුත්තලම මහාධිකරණය

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2023 නොවැම්බර් මස 27 වන දින

**Author (s) of report (වාර්තාවේ කතෘ හෝ කතෘන්):** එම්.එම්.කේ කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාර්තමේන්තුව)** | රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක මහතා සහ රජයේ අධිනීතිඥ සජිත් බණ්ඩාර මහතා | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව/ත්‍රස්ත විමර්ශන ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | 1. අබු හනීෆා මොහොමඩ් මුෆිස් හෙවත් මුෆිස් හෙවත් අබු දහිදා<br>2. අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් හමාස් හෙවත් අබු සාෆියා<br>3. මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ හෙවත් ගෆුර් මාමා හෙවත් ගෆුර් නානා හෙවත් අබු හදීද්<br>4. මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත් සාදික් අබ්දුල්ලා හෙවත් අබු උමර්<br>5. මොහොම්මදු ඊබ්රහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබු සෙයිද්<br>6. මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබු නජා | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | 1,2,4 වන චූදිත වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පෙනී සිටින ලදී.<br><br>3 වන චූදිත වෙනුවෙන් රජයෙන් පත් කළ නීතිඥ ඒ.එච් .එම් අල්තාෆ් මහතා පෙනී සිටින ලදී.<br><br>පෙර පරිදිම යනුවෙන් සටහන් කරන ලදී. | |
| **Aggrieved party (අගතියට පත් පාර්ශවය)** | - | |

| | | |
|---|---|---|
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | මාධ්‍යවේදීන් | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා, විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම සහ නයෝමි වික්‍රමසේකර විනිසුරුතුමිය යන මහාධිකරණ විනිසුරුවරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලෙන් මෙදින මෙම නඩුවේ අධිරණයේ කටයුතු සඳහා මහාධිකරණ විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා පමණක් පැමිණ සිටියේය. මෙම නඩුව සබැඳි ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලේ සභාපති විනිසුරුතුමන් මේ වන විට විශ්‍රාම ගොස් ඇති බවට සඳහන් කරන ලදී.

පෙර දිනදී 3 වන විත්තිකරු සබැඳි වෝයර් ඩයර් (voir - dire) විභාගය හා සබැඳිව 8, 10, 14, 16 යන සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කර තිබුණද එම සාක්ෂිකරුවන් මෙදින පැමිණ නොසිටියේය. 8 වන සාක්ෂි කරු සිවිල් සාක්ෂිකරුවකු බවටත්, 10, 14, 16 යන සාක්ෂිකරුවන් වෛද්‍යවරු බවටත් සඳහන් විය. 8 වන සාක්ෂි කරුගේ ලිපිනය පිළිබඳ ගැටළුවක් 3 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා අධිකරණය දන්වා සිටින ලදී. ඒ සම්බන්ධයෙන් අදාළ පියවර ගන්නා ලෙස තුන්වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ මහතාට අධිකරණයෙන් දැනුම් දෙන ලදී.

3 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා හෙට (28) දින මෙම නඩුව සඳහා කැඳවීමට සිතාසි නිකුත් කරන ලද 16 වන සාක්ෂිකරුව තාවකාලිකව මුදාහරින ලෙසත්, විත්තියේ සාක්ෂිකරුවන් වන 6, 7, 8 සාක්ෂිකරුවන් එක් දිනක කැඳවීමටත් 10, 14, 15 සාක්ෂිකරුවන්ව තව දිනක කැඳවීමටත් සිතාසි නිකුත කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. අදාළ ඉල්ලීමට අධිකරණයෙන් අවසර ලබා දෙන ලදී.

මෙහිදී කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයේ පැවැත්වෙන පාස්කු ප්‍රහාරය සම්බන්ධ ප්‍රධාන නඩුව පිළිබඳවද, එම නඩුවේ ඇතැම් චූදිතයන් මෙම නඩුවේද චූදිතයන් බවටද නීතිඥ මහතුන් විසින් අධිකරණය දැනුවත් කරන ලදී. ඒ අනුව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයේ පැවැත්වෙන එම නඩුව සෑම මසකම සති තුනක් එහි පැවැත්වීමට හැකි පරිදි, මෙම අධිකරණයේ මෙම නඩුව සෑම මසකම එක් සතියක දින තුනක් එකවර කැඳවන ලෙසටද අදාලව ඉල්ලීමක් කරන ලදී.

සියලු කරුණු සළකා බලා ඒ අනුව මෙම නඩුව 2024 ජනවාරි මස 30වන දින, 2024 ජනවාරි මස 31 වන දින, 2024 පෙබරවාරි මස 01 වන දින යන දින ත්‍රිත්වයේදීත් 2024 පෙබරවාරි මස 27 වන දින, 2024

පෙබරවාරි මස 28 වන දින සහ 2024 පෙබරවාරි මස 29 වන දින යන දිනයන්හේදී ද කැඳවීමට නියම කරන ලදී.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) -**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):**

2024 ජනවාරි මස 30වන දින, 2024 ජනවාරි මස 31 වන දින, 2024 පෙබරවාරි මස 01 වන දින

සහ

2024 පෙබරවාරි මස 27 වන දින, 2024 පෙබරවාරි මස 28 වන දින සහ 2024 පෙබරවාරි මස 29 වන දින

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**